**ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය

පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනා ගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(iv) ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංඛ්‍යා භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශ සමඟ එකඟ විය යුතුය. ඒ අනුව භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශනය අනුව තැන්පත් ලැබීම් රු.668,930,412 ක් වුවත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.669,451,137 ක් ලෙස රු.520,725 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම . | මෝටර් රථ දෙපාර්තමේන්තුව වෙනුවෙන් පවත්වාගෙන යන පොදු තැන්පත් ගිණුමේ ශේෂය ඒසීඒ 4 ආකෘතියෙහි ඇතුළත්ව ඇති අතර, ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | ඉහත තැන්පතු ලැබීම් වෙනත් ලැබීම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දැක්විය යුතු වුවත් එසේ දක්වා නොතිබුණි. | -ඉහත පරිදි- | - |

**1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සංඛ්‍යා භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශයේ සංඛ්‍යා සමඟ එකඟ විය යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ තැන්පත් ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 298,149,870 ක් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණත්, එය භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශ අනුව රු.297,167,561 ක් වී තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | - |
| (ආ) | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(**v**) ඡේදය ප්‍රකාරව ශුද්ධ වත්කම් ගණනය කළ යුතුව තිබුණි. ඉහත සඳහන් නිරීක්ෂණයද සැලකිල්ලට ගත් විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ වත්කම්වල අගය රු.92,297,970 ක අවාසි ශේෂය විය යුතුව තිබුණත් එය රු.93,280,279 ක අවාසි ශේෂයක් ලෙස දක්වා තිබුණි. | -ඉහත පරිදි- | - |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී කාර්යාලය විසින් රු. 575,606,446 ක තැන්පත් ආපසු ගෙවා තිබුණත්, මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කළ මුදල් ප්‍රවාහයේ එය දක්වා නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | - |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් වශයෙන් පිළිවෙලින් රු.66,156,983 ක් හා රු.121,641,845 ක ගණුදෙනු සිදු කර තිබුණත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ දක්වා නොතිබුණි. | -ඉහත පරිදි- | - |
| (ඇ) | කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ දී මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදී නොතිබුණ ද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැයකළ මුදල් ප්‍රවාහය යටතේ රු.697,248,291 ක් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | - |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **හානි පිළිබඳ ලේඛනය** | | |
| | හානි හා පාඩු පිළිබඳ ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කරමි. |
| (ආ) | **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය** | | |
| | විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී පවත්වා ගෙන යාමට කටයුතු කරමි. |
| (ඇ) | **රාජකාරී දුරකථන ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාරව රාජකාරී දුරකථන | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨයේ පරිදි | ඉදිරියේ දී පවත්වා ගෙන යාමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | ලේඛනයක් පවත්වා නොතිබුණි. | රාජකාරී දුරකථන ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | |
| (ඇ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය<br>-----------------------------------<br>---<br>වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාර කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කරමි. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| | XII පරිච්ඡේදයේ 1.9 වගන්තිය | ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරු වී පැමිණි ඇතැම් නිලධාරීන් පළමු පත්වීමේ දින සිට ලබා ගෙන ඇති වාර්ෂික නිවාඩු ප්‍රමාණයන් පිළිබඳ විස්තරයක් පෙර සේවා ස්ථානයෙන් ගෙන්වා ගෙන නිවාඩු ලේඛනයෙහි වාර්තා කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම. | නිලධාරීන් ස්ථාන මාරු වී පැමිණෙන විටදී ම නිවාඩු විස්තර නොලැබෙන අතර ඒවා පුද්ගලික ලිපි ගොනුව සමඟ ද ඉන් පසුව ද ලැබෙන අවස්ථා ඇත. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මුදල් රෙගුලාසි 103 හා 104 | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2016 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මු.රෙ. 104 (4) ප්‍රකාර පරීක්ෂණ කටයුතු සිදුකිරීම සඳහා ඉදිරියේ දී |

| | | | | |
|---|---|---|---|---|
| | | ජනවාරි 16 දින අනතුරකට ලක්වී තිබුණත්, ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් ගෙන නොතිබුණි. | | විධිමත් පරිදි පරීක්ෂණ මණ්ඩලයක් පත් කර මුදල් රෙගුලාසි ප්‍රකාර ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග ගෙන විගණනයට වාර්තා කරමි. |
| (ඇ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>----------------- | | | |
| | i. 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | 2018 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අයත් රජයේ වාහන 4 ක දැවෙන ඉන්ධන පිළිබඳ පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී නියමිත පරිදි ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කළ යුතු බවට මාගේ අංක DSH/ACC/02 හා 2019.01.25 දිනැති ලිපිය මගින් දැනුවත් කර ඇත. |
| | ii. 2013 ජුලි 05 දිනැති අංක HAF-03-ADMIN-02-002 දරන චක්‍රලේඛ ලිපියේ 04 හා 05 ඡේද | සෑම ග්‍රාම නිලධාරීවරයකු විසින් සති 02 කට වරක් කොට්ඨාශයේ අනවසර අල්ලා ගැනීම් /ඉදි කිරීම් සම්බන්ධයෙන් වාර්තාවක් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකළ අවස්ථා පැවතුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වීම. | නියමිත පරිදි දෙසති වාර්තා ලබා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **පරිපූරක ඇස්මේන්තු වෙන්කිරීම් මගින් ලබා ගත් ප්‍රතිපාදන ඉතිරි කිරීම**<br>2017 වර්ෂයේ සිදු වූ ගංවතුර හේතුවෙන් ආපදාවන්ට ලක් වූ ප්‍රදේශවල පුනරුත්ථාපන කටයුතු සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් යටතේ රු.208,810,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට එයින් රු.34,117,297 ක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 16 ක ප්‍රමාණයක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. | අවශ්‍යතා සලකා බලා කාර්යයන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන පමණක් සලසා ගත යුතු වීම. | කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත් අනුව ඇස්තමේන්තු කළ නමුත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්දේශ මත පදනම්ව ගෙවීම් කිරීමේ දී බිල්පත්‍ර වටිනාකම අඩු වීමත්, ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය විසින් වන්දි ලබා දීම නිසා ඇස්තමේන්තු වටිනාකම වියදම් නොවීමත් නිසා ප්‍රතිපාදන ඉතිරිව ඇත. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ක්‍රීඩා අමාත්‍යාංශය මගින් 2017 වර්ෂයේ දී රුහුණු මාගම්පුර පරිපාලන සංකීර්ණ පරිශ්‍රය තුළ ක්‍රියාත්මක කරන ලද ඇවිදීමේ මංතීරුව ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වැඩ විෂයන් 10 ක් සඳහා රු.2,113,447ක් ඇස්තමේන්තු කර තිබුණි. බිල් පත්‍ර පරීක්ෂාවේ දී | ව්‍යාපෘතිය සැලැසුම් කිරීමේ දී පූර්ව අධ්‍යනයකින් පසුව සියළු වැඩ ඇතුළත් කර ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | ව්‍යාපෘතිය සැලැසුම් කිරීමේ ගැටළු ඇති බව ව්‍යාපෘතිය කරගෙන යාමේදී අවබෝධ විය. මෙවැනි ඉදිකිරීමක ප්‍රථම අත්දැකීම මෙය වීම මීට ප්‍රධානම හේතුව වේ.<br>අමතර වැඩ හා අතිරේක වැඩ සඳහා අනුමැතිය ලබා |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත වැඩ වෙනුවෙන් රු.751,601 ක් ද, අමතර වැඩ සඳහා රු.273,258 ක් ද, අතිරේක වැඩ සඳහා රු.1,015,468 ක් ද වශයෙන් ගෙවීම් කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත වැඩ වටිනාකමින් සියයට 61 ක ප්‍රමාණයක් අමතර හා අතිරේක වැඩ ලෙස ගෙවා තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය නිම කළ දින සිට 2019 මැයි මාසය දක්වා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වන පරිදි භාවිතයට ගෙන නොතිබුණි. | | ගෙන ඇත. එමගින් අපේක්ෂිත ප්‍රතිඵල මෙතෙක් පූර්ණ වශයෙන් ළඟා කර ගැනීමට නොහැකි වුව ද, ඉදිරියේදී තවදුරටත් එය ප්‍රචලිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) | 2017 වර්ෂයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ කරමැටිය අඹගහහේන හරහා කෝන්ගස්තැන්න මාර්ගය කාපට් කිරීමේ දී ලබා ගත් සාවද්‍ය මිනුම් පදනම් කරගෙන කොන්ක්‍රීට් සඳහා රු.43,446 ක් ද, ඇස්පෝල්ට් වෙනුවෙන් රු.358,286 ක් ද, ඇස්පෝල්ට් ඇතිරීම හා තැලීම වෙනුවෙන් රු.49,860 ක් ද, ABC මිශ්‍ර ගල් සැපයීම වෙනුවෙන් රු.979,600 ක් ද, ABC මිශ්‍ර ගල් ඇතිරීම හා තැලීම වෙනුවෙන් රු.349,860 ක් ද ලෙස රු.1,781,052ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඉදිකිරීම්වලට අදාලව නිවැරදි මිනුම් ලබා ගෙන ඒ මත පදනම්ව ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් කළ යුතු වීම. | • හරස් කාණුව දෙපස මීටර් 4.9 ක කොටසෙහි තිබෙන තත්ත්වය සැලකිල්ලට ගෙන ඇස්ෆෝල්ට් වෙනුවට කොන්ක්‍රීට් අතුරා ඇති අතර ඒ සඳහා වියදම රු.59,880 මේ දක්වා ගෙවා නැත.<br>• ඇස්ෆෝල්ට් සඳහා ගෙවීම් කිරීමේ දී වැඩ බිමට සපයන ලද ඇස්ෆෝල්ට් ප්‍රමාණය අනුව වර්ග මීටර් 1907.12 ක් සඳහා ගෙවීම් කර ඇත.<br>• පෙර කාලයේ අතුරන ලද කොන්ක්‍රීට් තට්ටුව දෙපසින් උස් වී මැද පහත්ව තිබුණු අතර, දෙපස මග හරවා ගැනීම සඳහා ඇස්ෆෝල්ට් ඇතිරීමට සිදුව ඇත.<br>• ABC ඇතිරීම සඳහා ගෙවීම් කිරීමේ දී කාර්මික නිලධාරී මහතාගේ ක්ෂේත්‍ර පොතට අනුව මධ්‍යන අගය වන 212 mm ක් සඳහා ගෙවීම් කර ඇති අතර වැඩිපුර ගෙවීමක් සිදුව නැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉහත සඳහන් ව්‍යාපෘතියේ මාර්ගය දෙපස කොන්ක්‍රීට් කාණු හා කොන්ක්‍රීට් පැතිබැම් ඉදිකිරීම සඳහා කොන්ක්‍රීට් වෙනුවෙන් රු.916,200 ක් වියදම් කර තිබුණු අතර, ලී හැඩයම් වෙනුවෙන් රු.1,264,716 ක් වැය කර තිබුණි. ඒ අනුව ලී හැඩයම් සඳහා කොන්ක්‍රීට්වලට වඩා වැඩි වියදමක් කර තිබුණි. තවද 2018 අගෝස්තු 13 දින සිදු කළ භෞතික පරීක්ෂාවේ දී කොන්ක්‍රීට් කාණු හා පැති බැම් සඳහා ලී හැඩයම් අවශ්‍ය නොවන ස්ථානයක් සඳහා ලී හැඩයම් යෙදූ බවට ගණනය කර ගෙවීම් කර තිබුණි. | ව්‍යාපෘතිය පිළිබඳ මනා අධ්‍යයනයක් සිදු කර ව්‍යාපෘතියේ ස්වභාවය අනුව ඉටු කළ යුතු වැඩ විෂයයන් ඇතුළත් කර ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් කළ යුතු වීම. | වර්ග මීටර් 12 ක හැඩයම් සඳහා වැඩිපුර ගෙවා තිබුණු අතර එම මුදල රැඳවුම් මුදලින් අඩු කර ගැනීමට තීරණය විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම පරිදි දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මගින් 2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු රු.මිලියන 3.46 ක ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී තිබුණි. ඒ වෙනුවට දිස්ත්‍රික් සංවර්ධන සැලැස්මෙහි ඇතුළත් නොවූ රු.මිලියන 10.55 ක් වූ පරිබාහිර ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කර තිබුණි. | වාර්ෂික සංවර්ධන සැලැස්ම මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද යෝජනා සඳහා ප්‍රතිපාදන සලසාගෙන වර්ෂය තුළ දී ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතු වීම. | ව්‍යාපෘති යෝජනා හඳුනාගෙන ඒවා සඳහා ප්‍රතිපාදන ලැබේ යයි අපේක්ෂා කරමින් එම යෝජනා වාර්ෂික සංවර්ධන සැලැස්මට ඇතුළත් කරන ලදී. නමුත් මෙම ව්‍යාපෘති යෝජනා සඳහා අදාල අමාත්‍යාංශ විසින් ප්‍රතිපාදන ලබා නොදුන් විට එම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි විය. ඒ වෙනුවට අමාත්‍යාංශ විසින් වෙනත් යෝජනා සඳහා ප්‍රතිපාදන ලබා දුන් විට වාර්ෂික සංවර්ධන සැලැස්මට අනුකූලව කටයුතු කිරීම සිදු කළ නොහැකි විය. |
| (ආ) | ජාතික ළමාරක්ෂක අධිකාරිය හා පරිගණක පුහුණු ඒකකය මගින් | වාර්ෂික සංවර්ධන සැලැස්ම මගින් ක්‍රියාත්මක කිරීමට | අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදන මත මුල් සැලැස්මට ඇතුළත් නොවූ, නවක ග්‍රාම |

| | | |
|---|---|---|
| පිළිවෙලින් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු ව්‍යාපෘති 11 කින් 07 ක් හා ව්‍යාපෘති 26 කින් 20 ක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි. ඒ වෙනුවට ජාතික ළමාරක්ෂක අධිකාරිය මගින් දිස්ත්‍රික් සංවර්ධන සැලැසුමේ ඇතුළත් නොවූ ව්‍යාපෘති 03 ක් සහ පරිගණක පුහුණු ඒකකය මගින් දිස්ත්‍රික් සංවර්ධන සැලැස්මේ ඇතුළත් නොවූ ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කර තිබුණු බව 2018 වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව අනාවරණය විය. | සැලැසුම් කරන ලද ක්‍රියාකාරකම් වර්ෂය තුළ දී ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතු වීම. | නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම් වැනි වැඩ සටහන් දිස්ත්‍රික් පරිගණක පුහුණු ඒකකයෙන් ක්‍රියාත්මක කිරීමට සිදු විය. |

## 3.2 කාර්ය භාරයන් ඉටු නොකිරීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත 2018 නොවැම්බර් මාසයේදී ලබා දී තිබුණු රු.7,100,000 ක ප්‍රතිපාදනයෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට කිසිඳු ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි. | සලසා දෙන ප්‍රතිපාදන ඵලදායි ලෙස සංවර්ධන කටයුතු සඳහා යෙදවිය යුතු වීම. | අමාත්‍යාංශ විසින් ගිණුම් වර්ෂය අවසානයේ දී ප්‍රතිපාදන ලබාදීමත්, ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකර කාර්යයන් නිම කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීමත්, වැව් හා අමුණු ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවේ දී අධික වැසි නිසා බාධාවන් සිදුවීමත් වැනි හේතූන් මත අදාළ ව්‍යාපෘති ඉටු කිරීමට නොහැකි වී ඇත. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාර්ගයක කුට්ටිගල් ඇතිරීමේ ව්‍යාපෘතියක් සඳහා රු.3,535,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ සඳහා රු.2,425,452 ක් වැය කර තිබුණි. එම ඉදිකිරීම සඳහා භාවිතා කළ කුට්ටිගල්වල අපේක්ෂිත ශක්ති මට්ටම් පරීක්ෂා කිරීම සඳහා යොමු කළ නියැදි පරීක්ෂාවේ දී කුට්ටිගල්වල අපේක්ෂිත ශක්ති මට්ටම් සියයට 46 ක ප්‍රමාණයකින් ළඟා වී නොතිබුණි. | මාර්ග ඉදිකිරීමේ දී ඇස්තමේන්තුවේ සඳහන් පරිදි නියමිත ගුණාත්මක තත්ත්වයෙන් යුතු ද්‍රව්‍ය උපයෝගී කර ගෙන ඉදිකිරීම් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ මගින් පෙන්වා දී ඇති ස්ථානයන්හි දැනට අතුරා ඇති කැටගල් ගලවා ඉවත් කර නිසි ප්‍රමිතියෙන් යුතු කැටගල් අළුතෙන් අතුරා මාර්ගය සකස් කරන ලෙසත්, එසේ අතුරන කැටගල් නැවත තත්ත්ව පරීක්ෂාවකට යොමු කර එහි ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කරන බවත් අදාල කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇත. එතෙක් කර්මාන්තය සඳහා ගෙවීම් නතර කර ඇති අතර, අදාල නිවැරදි කිරීම් සිදුකර විගණනයට දන්වමි. |

## 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර මගින් කුඩා කණ්ඩායම් බිහි කර ග්‍රාමීය ඉතුරුම් ශක්තිමත් කර ණය සංවිධානයක් ස්ථාපිත කර ගැනීම අරමුණක් වී තිබුණත් 2019 ජනවාරි 31 දින වන විටත් හම්බන්තොට හා තංගල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසින් අදාළ අරමුණු ඉටුකිරීම සඳහා | ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | පළමු අදියරයේ ග්‍රාම ශක්ති සමිති බොහොමයක් විසින් මේ වන විට කුඩා කණ්ඩායම් බිහි කර ඇත. |

කටයුතු කර නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ආ) | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 හි ග්‍රාම ශක්ති ජනතා සමිති 36 ක් සඳහා 2018 සැප්තැම්බර් 04 දින ලබා දුන් රු.මිලියන 36 කින් රු.මිලියන 29.6 ක් විගණිත දිනය වූ 2019 ජනවාරි 31 දින වන විටත් ග්‍රාම ශක්ති සමිති විසින් හඳුනාගත් සංවර්ධන කාර්යය සඳහා වියදම් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂය අවසාන භාගයේ මෙම සමිති ලියාපදිංචිය සිදු කරන ලද අතර, ඒ අනුව එම සමිති තවමත් මූලික අදියරේ කටයුතු සිදුවන බැවින් එම සමිති සඳහා ලබා දෙන ප්‍රාග්ධන මුදල් ආයෝජනයට නිසි ක්‍රමවේදයක් හා නිසි ලිපි ලේඛන ලබා දීම සිදුව නොමැත. එබැවින් සමිතිවල අරමුදල් තවමත් සමිති තැන්පතු වශයෙන් පවතී. |

### 3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ------------------------------------ |
| (අ) | අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැරණි කාර්යාල ගොඩනැගිල්ල ඉවත් කර එම ස්ථානයේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 වන දින ඉංජිනේරු සේවා පුද්ගලික සමාගමක් වෙත රු.12,796,000 ක් ගෙවා තිබුණි. එම ගෙවීමෙන් පසු මාස 05 කට අධික කාලයක් ගතවී තිබුණද, 2019 මැයි 10 දින වන විටත් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | නියමිත ගිවිසුම් කාලසීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ගිවිසුම්ගත වූ වහාම ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වීම. | මුල් ගල් තබා වැඩ ආරම්භ කිරීම සඳහා දින ලබා ගැනීම සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු, අභ්‍යන්තර කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත අවස්ථා ගණනාවක දී ලිඛිතව හා වාචිකව දැනුවත් කර ඇතත් මේ වන තෙක් ඊට දින ලබා නොදීම හේතුවෙන් ප්‍රමාදවීම සිදුව ඇත. |
| (ආ) | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.16,451,106 ක් වූ සිප්පිකුලම පුම්මා පල්ලිය | නියමිත ගිවිසුම් කාලසීමාව තුළ ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු වීම. | දිගින් දිගටම කාර්යය ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් අදාළ කොන්ත්‍රාත්කරු අවස්ථා කිහිපයක දී දැනුවත් කර ඇත. මේ වන විට මාර්ගය කාපට් කර ඇති |

| | | |
|---|---|---|
| පාර කාපට් කිරීමේ ව්‍යාපෘතිය 2018 ඔක්තෝබර් 05 වන දින අවසන් කළ යුතුව තිබුණත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණි. එදින වන විට කොන්ත්‍රාත්කරු වෙත රු.3,486,359 ක් ගෙවා තිබුණි. | | නමුත් වැඩ අවසන් කර නොමැත. කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් CIDA ආයතනය දැනුවත් කිරීමටත්, ප්‍රමාද ගාස්තු අය කර ඉදිරි ගෙවීම් සිදු කිරීමටත් කටයුතු කරනු ලැබේ. |

**3.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන යටතේ 2017 දෙසැම්බර් 30 දින තංගල්ල ප්‍රාදේශීය ලේකම් විසින් හම්බන්තොට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත රැකව කලපුව සීමා මායිම් යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.1,625,511 ක් ගෙවීම් කර තිබුණි. මුදල් ගෙවා වර්ෂයක කාලයක් ගතවී තිබුණ ද 2018 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ කාර්යය ඉටු කර නොතිබුණි. | රජය සතු මුදල් වියදම් කරන ලද කාර්යය නිසි පරිදි කඩිනමින් ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | රජයේ ඉඩම් නිරවුල් කිරීම සඳහා මැනුම් සකස් කරන එකම ආයතනය මිනින්දෝරු දෙපාර්තමේන්තුව වීමත්, එම ආයතනය විසින් සම්පූර්ණ මුදල් ගෙවන තෙක් මැනුම් කටයුතු ආරම්භ නොකිරීමත් නිසා සම්පූර්ණ මුදල් ගෙවා ඇත. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව මේ වන විට මැනුම් කටයුතු ආරම්භ කර ඇත. නමුත් මේ දක්වා සිතියම ලැබී නැත. |

**3.7 වෙනත් නිරීක්ෂණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සීනිමෝදර නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ කළුගල්ආර, ලැබීම ලොට් අංක 01 දරන ඉඩමෙහි කළුගල් | රජයේ ඉඩම් නිශ්චිතව මායිම් යොදා පිඹුරුපත් සකසා දේපල ආරක්ෂා කර ගැනීමට පියවර ගත යුතු වීම. | රජය සතු ඉඩමේ මායිම නිශ්චිතව හඳුනා ගත නොහැකි බැවින් මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ ගැටළුවක් මතුව ඇත. ඉඩම මැනුම් කටයුතු සඳහා ඉල්ලීමක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත යවා |

| | | | |
|---|---|---|---|
| | කැනීම සඳහා බලපත්‍ර නිකුත් කර තිබුණි. කළුගල් ව්‍යාපාරය කරගෙන යාමේදී මීට යාබදව පිහිටි රජයට අයත් ගල්පල ඉඩම අනවසරයෙන් පරිහරණය කර තිබුණි. | | ඇත. ඉඩම මැන පිඹුරුපත් ලැබුණු පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනිමි. |
| (ආ) | කිරින්ද ඌරණිය ප්‍රදේශයේ මුහුදේ ගිලී තිබූ “රුව්හෙර” නම් නෞකාවේ සුන්බුන් ඉවත් කිරීමේ කාර්යය 2010 වර්ෂයේ දී ධීවර සමූපකාර සමිතියක් වෙත පවරා තිබුණි. ඒ වෙනුවෙන් එම සමිතිය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පත් කරන ලද රු.3,500,000 ක තැන්පතු මුදල 2018 දෙසැම්බර් 31 දින ආපසු ගෙවා තිබුණ ද එම ගෙවීමේ දී පහත අඩුපාඩු අනාවරණය විය. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | |
| | (i) තැන්පත් මුදල් ආපසු ගෙවීමේ දී මුදල් තැන්පත් කළ ලදුපත්‍ර දෙකෙහි මුල් පිටපත්, වවුචරය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | | තැන්පත්කරුවන් විසින් ඡායා පිටපත් ඉදිරිපත් කර තිබුණු අතර අපගේ පොත්පත්වල පවතින කුවිතාන්සියේ අනුපිටපත් සමඟ පරීක්ෂා කර නිවැරදිතාවය තහවුරු කර ගන්නා ලදී. |
| | (ii) කොන්ත්‍රාත්කරු තෝරා ගත් පදනම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | නාවික හමුදාව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නැව් අංශය, සමුද්‍ර දූෂණ වැලැක්වීමේ අධිකාරිය යන ආයතන වල උපදේශකත්වය හා එකඟතාවය මත අදාල සමිතිය වෙත ලබා දී ඇත. |
| | (iii) කොන්ත්‍රාත්තුව පැවරීමේ දී දෙපාර්ශවය අතර විධිමත් කොන්දේසි | | මෙවැනි කටයුත්තක් සම්බන්ධයෙන් අත්දැකීම් නොමැතිවීම මත කොන්දේසි සහිත ලිපියක් මගින් අදාල සමිතිය |

| | | |
|---|---|---|
| සහිත ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | | වෙත පවරා දී ඇති අතර එයට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් සහ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අනුමැතීන් ලබා ගෙන ඇත. |
| (iv) කොන්ත්‍රාත්කරු කාර්ය නිම නොකර ඉන් ඉවත් වී තිබිය දී තැන්පත් මුදල ආපසු ගෙවා තිබුණි. | | අද වන විට ද ඉතිරි කොටස් ඉවත් කළ නොහැකිව පවතී. |
| (v) නැවෙන් ඉවත් කරන ලද සුන්බුන් ප්‍රමාණය කොපමණ ද යන්න වාර්තාගත කර නොතිබුණු බැවින් රාජ්‍ය ආදායමට අයවිය යුතු සියළු මුදල් අය වූ බවට සාක්ෂි නොතිබුණි. | | ඉවත් කරන ලද සුන්බුන් ප්‍රමාණය ග්‍රාම නිලධාරී හා සමුද්‍රිය පරිසර අධිකාරියේ අධීක්ෂණය මත වාර්තා ලබා ගෙන ඇත. ඒවා කිරා ඊට රේගු ගාස්තු ගෙවීමෙන් අනතුරුව පමණක් ඉවත් කර ගැනීමට අනුමැතිය ලබා දී ඇත. |

## 3.8 වාර්ෂික කාර්යසාධන වාර්තාව

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ 4 ක් විසින් කාර්යයන් 11 ක් සම්බන්ධයෙන් ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රතිශතය සියයට 4 ක සිට සියයට 77 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක අඩු ප්‍රගතියක් ලබා ගෙන තිබුණි. | අපේක්ෂිත කාර්යසාධන ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වකුගඩු ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා ආධාර ලැබිය යුතු රෝගීන් නිර්දේශ නොවීම හා වකුගඩු ආධාර හැර අනෙකුත් ආධාර ලබාදීම සඳහා නියමිත ප්‍රතිපාදන නොලැබීම,<br><br>වෘත්තීය මාර්ගෝපදේශ හා මානව සම්පත් අංශයේ ලියාපදිංචි කිරීම් හා සේවා සඳහා ප්‍රතිලාභීන් ඉදිරිපත් නොවීම,<br><br>කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ කටයුතු සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ තාක්ෂණය හා උපදේශනය ලබා ගැනීමට ප්‍රතිලාභී ඉල්ලීම් ඉදිරිපත් නොවීම යන කරුණු නිසා ඒ ඒ අංශවල කාර්යසාධනය අඩු වී ඇත. |

කෘෂිකර්ම අමාත්‍යාංශයේ වගා ළිං සඳහා ප්‍රතිපාදන ප්‍රතිලාභී ලැයිස්තු වර්ෂය අවසානයේ ලබාදීමත් එම අවස්ථාවේ පැවති වර්ෂාව හා කාලය ප්‍රමාණවත් නොවීමත් නිසා අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි විය.

**3.9** **පාඩු හා හානි**
**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | ------------------------------------- |
| (අ) | 1987 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරාසයක සිට අවස්ථා 28 කට අදාළව එකතුව රු.9,659,649 ක පාඩු හා හානි පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම පාඩු හා අලාභ අයකර ගැනීමට හෝ පොත් වලින් කපාහැරීමට හෝ අපොහොසත් වී තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | රු.250,000 ට අඩු හානි හා පාඩු සම්බන්ධ සිදුවීම් 5 ක් 1987 වර්ෂයේ පැවති භීෂණ සමයේ දී සිදුව ඇත. ඊට අදාළ ලේඛන අවස්ථානගත වී ඇති බැවින් ඒ පිළිබඳ සොයා බැලීමට කමිටුවක් පත් කර ඇත.<br><br>රු.250,000 ට වැඩි හානි හා පාඩු වලින් 1987 භීෂණ සමයේ සිදුවීමකට අදාළ ලිපිගොනුවක් සම්බන්ධයෙන් මු.රෙ. 104(4) යටතේ පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. ඊට අදාළ ලේඛන අස්ථාන ගතවී ඇති බැවින් ඒ පිළිබඳ සොයා බැලීමට කමිටුවක් පත් කර ඇත.<br>ඉතිරි සියළු ලිපි ගොනු සම්බන්ධයෙන් මේ වන විට ඉදිරි කටයුතු කරමින් පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.2,544,082 ක් වටිනා අලාභහානි සම්බන්ධ තොරතුරු ඇතුළත් ලිපිගොනු 14 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඇතුළත් ලිපිගොනු යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. | ලිපිගොනු 04 ක් මු.රෙ. 104(4) පරීක්ෂණය සඳහා භාර දී එම පරීක්ෂණය අවසන් වීමෙන් පසුව මේ වන විට ආපසු භාර දී ඇත.<br><br>ගොනු 02 ක් මු.රෙ. 109 |

| | | | |
|---|---|---|---|
| | | | යටතේ හානි පාඩු කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශයට භාර දී ඇත.<br><br>ඉතිරි ලිපිගොනු 08 ඉතා පැරණි ගොනු වන අතර, ඒවා සම්බන්ධයෙන් තොරතුරු සොයා ගත නොහැකි බැවින් කමිටුවක් පත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2015 ජනවාරි 01 දින අනතුරට පත්ව තිබුණි.එම අවස්ථාවේ දී රථයේ ගමන් කළ ප්‍රාදේශීය ලේකම් විසින් ලබා දුන් උපදෙස් මත රියදුරු ක්‍රියා කර තිබුණි. අනතුරට අදාලව මු.රෙ. 104(4) අවසන් පරීක්ෂණ වාර්තාව අනුව අලාභය සම්බන්ධයෙන් රියදුරු සහ ප්‍රාදේශීය ලේකම්වරයා වගකිව යුතු බව නිර්දේශ කර තිබුණි. එසේ වුවද නිර්දේශිත අලාභය වූ රු.397,869 ක් හා සියයට 25 ක දෙපාර්තමේන්තු ගාස්තුව ලෙස රු.99,468 ක් ද ඇතුළත්ව රු.497,337 ක සම්පූර්ණ අලාභය කැබ් රථයේ රියදුරුගෙන් අය කර ගැනීමට නිර්දේශ කර තිබුණි. 2019 ජූලි මාසය වන විටත් එකී අලාභය අයකර නොතිබුණි. | පරීක්ෂණ වාර්තාවේ නිර්දේශය පරිදි අලාභයට වගකිව යුතු සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. | සම්පූර්ණ අලාභයෙන් රක්ෂණ සමාගමෙන් ආවරණය කර ඇති මුදල අඩු කර රජය විසින් දරන ලද රු.52,337 ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට යෝජනා කර ඇත. රියදුරු විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බැවින් ඊට අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බැවින් ඊට අමාත්‍යාංශය විසින් තීරණයක් ලබා දෙන තෙක් මේ වන තුරු අය කර ගැනීම් සිදු කර නැත. |

**3.10 කළමනාකරණ දුර්වලතා**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ---------------------------------- |
| කැකිරිඕබඩ ජලාශය ඉදිකිරීමට අදාළව තුන්වන අදියරය යටතේ අත්පත් කරගෙන තිබුණු ඉඩම් කැබලි 36 ක් සඳහා වන්දි ගෙවීමට තක්සේරු වාර්තා ලබා ගත යුතුව තිබුණි. 2014 ජනවාරි 28 දින සිට 2017 අගෝස්තු 09 දින දක්වා කාලපරිච්ඡේදය තුළ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එම ඉඩම් කැබැලි වල තක්සේරු වාර්තා ඉල්ලා තිබුණද 2019 පෙබරවාරි 20 දින වන විටත් එම ඉඩම් කැබලි සඳහා තක්සේරු වාර්තා ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. | ඉඩම් කැබලි වෙනුවෙන් වන්දි ලබා දීම කඩිනම් කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර තක්සේරු වාර්තා ලබා ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ගයක් ගත යුතු වීම. | පළමු අදියරය යටතේ ඉඩම් අත්පත් කර ගැනීමේ දී අනවසර ඉඩම් සඳහා වන්දි ගෙවීමට ලබාදී තිබුණු විශේෂ කැබිනට් මණ්ඩල අනුමැතිය තුන්වන අදියරය සඳහා ද ආවරණය වන බවට වූ ලිපිය හා අදාළ ඉඩම් හිමියන්ගේ නාම ලේඛනය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇතත් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඒ සම්බන්ධයෙන් මෙතෙක් ප්‍රතිචාර දක්වා නොමැත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**---------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | --------------------------------- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟා කර ගත යුතු අරමුණු සහ ඉලක්ක කරා ළඟාවීමේ සූදානම පිළිබඳ පරීක්ෂා කිරීමේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට අවශ්‍ය සැලැසුම් සකස් කිරීම, එම ඉලක්ක කරා ළඟාවීම මැනිය හැකි දර්ශක හා සන්ධිස්ථාන හඳුනා ගැනීමට 2018 වර්ෂය තුළ දී කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට අවශ්‍ය සැලැසුම් සකස් කර ඒවා ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |

**5. යහපාලනය**

**-------------**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීමේ දී සෑම වසමකටම බෙදී යන පරිදි ව්‍යාපෘති අනුමත කරවාදීමට කටයුතු කළ යුතු වුවත්, පරීක්ෂාවට ලක් කරන ලද වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 53 කින් 18 කට කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් 2018 වර්ෂය තුළ අනුමත කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෑම වසමකටම සංවර්ධන ව්‍යාපෘති මඟින් ප්‍රතිලාභ බෙදී යන පරිදි ව්‍යාපෘති අනුමත කරවාදීමට කටයුතු කළ යුතු වීම. | ග්‍රාම නිලධාරී වසම් 53 ක් සඳහා 2018 වර්ෂයේ හඳුනා ගත් ව්‍යාපෘති සම්බන්ධයෙන් බලධාරීන්ගේ අවධානයට යොමු කර ඇතත් ඉන් ව්‍යාපෘති කිහිපයක් සඳහා පමණක් අනුමැතිය ලැබී ඇත. |

**5.2 අභ්‍යන්තර විගණනය**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සියල්ලෙහිම පිහිට වූ ග්‍රාම ශක්ති ජනතා සමිති සඳහා අභ්‍යන්තර විගණන වැඩපිළිවෙලක් පිළියෙල කර නොතිබුණි. | ග්‍රාම ශක්ති උපදෙස් පත්‍රිකා 2018-(3) දරන 2018 ජුලි 12 දිනැති පත්‍රිකාව ප්‍රකාරව ග්‍රාම ශක්ති ජනතා සමිති සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කළ යුතු වීම. | ග්‍රාම ශක්ති සමිතිවල අභ්‍යන්තර විගණනය සඳහා විගණන කමිටු පත් කර ඇති අතර මව් සමිතියේ ගනුදෙනුවල දී අදාළ වන ලිපි ලේඛන හා ගිණුම් ක්‍රමවේදය ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මේ වන තෙක් ලබා නොදීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැත. |

**6. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 82 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. අතිරික්ත කාර්ය මණ්ඩලය 22 දෙදෙනෙකු වී තිබුණත් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සහ අතිරික්තතා මග හරවා ගැනීමට කටයුතු කළ යුතු වීම | සමස්ථයක් ලෙස ගත් විට පවතිනුයේ පුරප්පාඩු පමණි. අතිරික්ත ලෙස දැක්වීම සිදු වන්නේ අදාළ ශ්‍රේණියට වැඩි ප්‍රමාණයක් එම ශ්‍රේණියේ සිටීමයි.<br><br>පුරප්පාඩු සම්බන්ධයෙන් සෑම වර්ෂයකදීම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට කටයුතු යොදා ඇති අතර නවක නිලධාරීන් ලද පසු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරයි. |